පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ජූලි හතරවන සතිය

ශ්‍රේණිය - 9

සැකසුම - එම්.නිලිකා දිල්හාරි

# සති පාසල කාර්යය පත්‍රිකාව

නිපුණතාව 3.0: පාරිභාරික අවශ්‍යයතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.

නිපුණතා මට්ටම 3.2: රෙදිපිළි සඳහා ව්‍යාප්ත සැරසිලි නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම-3.2.1 : කාන්තා/ පිරිමි භාවිතයට සුදුසු රෙදිපිළි සඳහා ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කරමු.

## පෙර ඉගෙනුම් අවස්ථා/.ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්


ව්‍යාප්ත මෝස්තරයක් සැලසුම් කිරීම

### අඟල් 9x9 ප්‍රමාණයට මෝස්තරය සැලසුම් කිරීම

අඳින කඩදාසියේ මැදට වන්නට නිවැරදිව සමචතුරස්‍රාකාරව ඇඳගැනීම සිදු කරන්න

අඟල් 12 හෝ 18 ප්‍රමාණයේ දිග රූලක් භාවිතා කරන්න


කෝණමානය භාවිතයෙන් නිවැරදිව තිරස හා සිරස් රේඛා නිර්මාණය කරගන්න.




01.පහත දැක්වෙන අනුපිළිවෙල හොඳින් අධ්‍යයනය කරන්න.

## ව්‍යාප්ත මෝස්තරයක් සැලසුම් කිරීම


- මෙහිදී දිග අඟල් 9 පළල අඟල් 9 ප්‍රමාණයේ කොටසක නිර්මාණය කිරීම.
- මෝස්තර ඒකකය 4 වරක් හෝ ආසන්න ප්‍රමාණයක් ඇඳීම
- ඒ නිසා මෝස්තර ඒකකය දිග අඟල් 4.5  පළල අඟල් 4.5 ප්‍රමාණයට හෝ මදක් කුඩාවට නිර්මාණය කිරීම.
- නිදහස් ශෛලිය භාවිත කරමින් මෝස්තරය සැලසුම් කිරීම




දළ සැලසුම





මෝස්තර ඒකකය




ව්‍යාප්ත කරනු ලබන ආකාරය

### ව්‍යාප්ත මෝස්තරයක් සැලසුම් කිරීම





සැලසුම

අඳින කඩදාසිය




- සැලසුමෙහි ආකාරයට අඳින කඩදාසියේ සළකුණු යොදන්න. රේඛා අඳින්නේ නම් ඉතා ලා පැහැයෙන් යුතු රේඛා නිර්මාණය කරගන්න.

## මෝස්තර ඒකකය සැලසුම් කිරීම





දිග අඟල් 4.5 හා පළල අඟල් 4.5 ප්‍රමාණයේ සමචතුරස්‍රයක් ඇඳ
එහි නිදහස් ශෛලියෙන් මලක් අඳින්න. මලෙහි මැද කොටස හා සාළු නිර්මාණය කරන්න





- මෝස්තර ඒකකය සහිත කඩදාසිය වෙන් කරගෙන එහි එක් පසක ඉහල ඊ හිසක් යොදා ගන්න එය ඔබට දිශාව තීරණය කිරීමට පහසු වේ.
- මෝස්තර ඒකකය හතරට බෙදෙන සේ නවා ගැනීම හෝ වර්ණ පෑනකින් රේඛා මගින් ඇඳගන්න.
- එම කොටස් A, B, C, D, ලෙස නම් කරගන්න.

ව්‍යාප්ත මෝස්තරයක් සැලසුම් කිරීම




- සූදානම් කරගත් අඳින කඩදාසියේ පහළ වම් පස කෙළවරෙහි මෝස්තර ඒකකය තබා B කොටස පිටපත් කර ගන්න
- එම ආකාරයටම C කොටස ඉහළ වම් පසත් D කොටස ඉහළ දකුණු පසත් පිටපත් කරගන්න.





- අඳින කඩදාසියේ ඉහල මැද මෝස්තර ඒකකය හරවා තබා A,B කොටස් ඉහත ආකාරයට පිටපත් කර ගන්න.
- අනතුරුව පහළ කොටසට මෝසතර ඒකකයේ CD කොටස් පිටපත් කරගන්න.

මායිම් මෝස්තරයක් සැලසුම් කිරීම





- අඳින කඩදාසියේ මැද වම සහ දකුණ කොටස්, මෝස්තර ඒකකය හරවා තබා දකුණු පස A,B කොටස් ද වම්පස DC ඉහත ආකාරයට පිටපත් කර ගන්න.




- මැද කොටසට මෝස්තර ඒකකය පිටපත් කර සම්පූර්ණ කරගන්න



- වර්ණ කර නිර්මාණය අවසන් කරන්න







02. ව්‍යාප්ත සැරසිලි සම්බන්ධව සැකසුනු වීඩියෝ පට බලන්න.ඒ සඳහා පහත යූ ටියුබ් සබැඳි උපයෝගී කර ගන්න.

https://youtube.com/c/ChannelNIE

https://youtu.be/xa214T6P4LO

3.ඉහත ද්‍රව්‍ය බලා ඇඳීම ක්‍රියාකාරකම සඳහා උපකාර කරගත හැකි පොත්පත්,web site,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක-

- e-තක්සලාව
- you tube-
- ආදර්ශ සිතුවම්-
- අතිරේක පොත්/ සගරා
- චිත්‍ර ඇඳීම සම්බන්ධ පොත්

.

චිත්‍රයක් නිර්මාණයේදී පළමුව රේඛා ඇඳීම ප්‍රගුණ කරන්න.

- මෙම අභ්‍යාස සිදු කිරීමේදී අත සැහැල්ලුවෙන් ඇඳීම කළ යුතුය.
- අත අඳින කඩදාසිය මත තබා ගැනීම නොකළ යුතුය. අත කඩදාසියෙන් ඔසවා (කඩදාසියේ ගෑවෙන නොගෑවෙන තරමට) ඇඳීම සිදු කරන්න.
- අත සැහැල්ලුවෙන් චිත්‍ර ඇඳීම පුරුද්දක් කරගන්න.

.<u>**ඉගෙනුම් පල**</u>

- ස්වභාවික හා නිර්මිත හැඩ ව්‍යාප්ත සැරසිලි සඳහා යොදා ගත හැකි බව ප්‍රකාශ කරයි
- එම හැඩ නිර්මාණාත්මකව භාවිතා කල. හැකි බව ප්‍රකාශ කරයි
- නිර්මාණය කරන ලද සැරසිලි ඒකකයවිධිමත් රටාවකට ව්‍යාප්ත කරමින් මෝස්තරය සැලසුම් කරයි.
- උචිත පරිදි ජ්‍යාමිතික උපකරණ භාවිත කරයි.
- උචිත ශිල්ප ක්‍රම භාවිතා කරමින් වර්ණ ගන්වයි.
- නිර්මාණ අගයමින් රස විදියි.

## පසු ඉගෙනුම් අවස්ථා

- ස්වභාවික පරිසරයේ ඇති විවිධ පත්‍ර,ඵල වල රූප දළ සටහන් පොතක් ආධාරයෙන් ඇද තබාගන්න.
- එම හැඩ නොයෙක් වෙනස්කම් වලට භාජනය කරමින් නව හැඩතල නිර්මාණය කරන්න.
- නිර්මාණශීලිව මෝස්තර ඒකකයන් ගොඩ නගන්න.
- එය පුරුද්දක් ලෙස අනුගමනය කරන්න.
- නිතර නිතර අභ්‍යාසකරණයේ යෙදෙන්න.

## බාහිර ඉගෙනුම් අවස්ථා /සහායක ඉගෙනුම් ආධාරක/ඉහත ක්‍රියාකාරකම් සදහා උපකාර කර ගත හැකි දේ.

**පොත්පත්-**

- සිත්තර මග-සොලමන් ප්‍රේමානන්ද
- පැරණි සිංහල චිත්‍ර සැරසිලි මෝස්තර-ටී.යූ ද සිල්වා
- චිත්‍ර කලාව අතිරේක කියවීම් පොත-ජාතික අධ්‍යාපන ආයතනය
- චිත්‍ර කලාව-අසිත අමරකෝන්

**යූ ටියුබ් සබැදි-**

https://youtube.com/c/ChannelNIE

https://youtu.be/xa214T6P4LO

.ඊ පාසල් පාඩම්- e thakshalawa-www.e-thaksalawa.moe.gov.lk